**මැදගම ප්‍රාදේශීය සභාව - 2022**

**--------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මැදගම ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මැදගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේමූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය  මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය  ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත .

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ  ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ)  (iii) වගන්තියේ සඳහන්  අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ ප්‍රාග්ධනිත කරන ලද රු. 500,000 ක් වටිනා උපකරණ 03 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි යටතේ නැවත ප්‍රාග්ධනිත කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී එම වරද නිවැරදි කරන බව කාරුණිකව දන්වමි. | ගිණුම්වල ගැලපීම් කර මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබුණු රු.1,599,620 ක් වූ පුටුවල වටිනාකම ලී බඩු උපකරණ යටතේ සහ ඉඩම් හා ගොඩනැගිලි යටතේ දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී එම වරද නිවැරදි කරන බව කාරුණිකව දන්වමි. | ද්විගණන දෝෂ ඇති නොවන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීම් කර්මාන්ත 05 ක් වෙනුවෙන් වැය කරන ලද රු. 8,341,743 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණු අතර එක් කර්මාන්තයක් වෙනුවෙන් වැයකර තිබුණු රු.179,834 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම පිළියෙල කිරීමේදී අදාල වැරදි නිවැරදි කරන බව කාරුණිකව දන්වමි. | වත්කම්වල නිවැරදි වටිනාකම් ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඈ) | සතිපොලේ පිහිටි එළුමස් වෙලඳසැල, ඌරු මස් වෙළඳසැල සහ ළමා උද්‍යානය සඳහා විදුලිය සහ ජල සම්බන්ධතා ලබා ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී වැයකර තිබුණු රු.76,500 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම සැකසීමේදී එම වියදම ප්‍රාග්ධනිත කර ගිණුම නිවැරදි කරන බව කාරුණිකව දන්වමි. | වියදම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (ඉ) | සම්මන්ත්‍රණශාලාවට සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගත් රු. 767,050 ක් වටිනා ශබ්ද පරිපාලන යන්ත්‍රයේ වටිනාකම ඉඩම් හා ගොඩනැගිලි යටතේ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී එම වරද නිවැරදි කරන බව කාරුණිකව දන්වමි. | ද්විගණන දෝෂ ඇති නොවන පරිදි නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල වටිනාකම් ඇතුලත් කළ යුතුය. |
| (ඊ) | ක්‍රීඩාංගනයේ වැසිකිලි පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා වැය කර කිබුණු රු.100,000 ක මුදල, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු. 10,000,000 ක් ලෙස දක්වා තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී එම වැඩි වූ මුදල ඉවත් කර ගිණුම නිවැරදි කිරීමට සටහන් කර ගත් බව කාරුණිකව දන්වමි. | වටිනාකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | සභාව විසින් බාහිර පාර්ශවයන්ට පවරන ලද නඩු 02 ක් හා බාහිර පාර්ශවයන් විසින් සභාවට විරුද්ධව පවරන ලද නඩු 02 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2023වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී එම තොරතුරු හෙළිදරව් කරන බව කාරුණිකව දන්වමි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී හෙළිදරව් කිරීම් නිවැරදිව සිදුකළ යුතුය. |

### 1.6.2 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩ සටහන යටතේ ක්‍රියාත්මක කරන ලද පුහුණු පාඨමාලාවකට සභාවේ නිලධාරියෙකු සහභාගී වී තිබුණු අතර ඊට අදාලව පුහුණුලාභියා පෞද්ගලිකව දැරිය යුතු සියයට පනහක පාඨමාලා ගාස්තුව රු.19,750 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. | ඉදිරියේදී එම මුදල් නිලධාරියාගේ මාසික වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | පාඨමාලාවට අදාලව පෞද්ගලිකව දැරිය යුතු ගාස්තුව අදාල නිලධාරියා විසින් ගෙවිය යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු.1,709,864,049 ක් වූ වත්කම් විෂයයන් 05 ක් සම්බන්ධයෙන් පිළිගත් වෘත්තිය තක්සේරුකරුවන්ගේ වාර්තා, හිමිකම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛන සහ හිඟ යන්ත්‍ර ආදායම් පිළිබඳ ලේඛනය ඉදිරිපත් නොකිරීම නිසා එකී වත්කම්වල අගය විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | සභාවට අයත් ඉඩම් තක්සේරු කර නිරවුල් කර ගැනීමටත් අනෙකුත් ලේඛන සහ උපලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාමටත් ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013 ජුනි 28 දිනැති අංක 1816/43 දරන ගැසට් පත්‍රය | සභාව සතු පුස්තකාල 03 ක පාඨකයින් 5966 ක් ලියාපදිංචි වී තිබුණු අතර ඔවුන්ගෙන් පොත් බැහැර දීමේදී අය කළයුතු රු.100 ක පුස්තකාල තැන්පතු මුදල් අයකරගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබාගෙන ඉදිරියේදී නිවැරදි කිරීම් සිදු කරන බව කාරුණිකව දන්වමි. | ප්‍රාදේශීය සභාව විසින් මේ වන විට වැලඳගෙන ඇති පුස්තකාල සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 8 වන වගන්තිය සහ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය | සභාව විසින් 2017 සිට 2021 කාල පරිච්ඡේදය තුල අනුමතකර තිබුණු ගොඩනැගිලි සැලසුම් 137 ක් පරීක්ෂා කර අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | **2017-2021** වර්ෂවල අනුමත කළ ගොඩනැගිලි සැලසුම් සඳහා අනුකූලතා සහතික 36ක් නිකුත් කොට ඇති අතර අනුමත කළ ගොඩනැගිලි සැලසුම්වලට අදාල ඉදිකිරීම්වල වැඩ අවසන් කොට ඇත් නම් ඒ සඳහා අනුකූලතා සහතික ලබා ගන්නා මෙන් දන්වා ඇත. | අනුමත කළ ගොඩනැගිලි සැලසුම්වලට අදාලව ඉදිකිරීම් පරීක්ෂා කර අනුකූලතා සහතික නිකුත් කළ යුතුය. |
| (ඇ) | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය | සභාව විසින් පවත්වාගෙන තිබුණු වීථි පහන් ලේඛනය අනුව, සභා බලප්‍රදේශයේ වීථි පහන් 690 ක් සවිකර තිබුණද,වීථි ආලෝකකරණය සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගතවී නොතිබුණි. | අප සභාව විසින් මේ වන විට ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්වලට එළඹ නොමැති අතර ගැටළුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙතද ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 11,588,389 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 13,897,043 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 825,538 | 1,400,095 | 1,035,237 | 364,858 | 955,538 | 858,399 | 591,750 | 266,648 |
| (ii) | කුලී | 23,900,017 | 33,162,510 | 24,373,574 | 8,788,936 | 22,568,300 | 30,248,347 | 23,592,018 | 6,656,329 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 532,320 | 216,708 | 216,708 | - | 733,312 | 253,628 | 253,628 | - |
| (iv) | වෙනත් ආදායම් | 17,797,300 | 9,290,194 | 6,289,744 | 3,000,450 | 21,616,020 | 7,310,751 | 5,913,110 | 1,397,642 |
| | **එකතුව** | 43,055,175 | 44,069,507 | 31,915,263 | 12,154,244 | 45,873,170 | 38,671,125 | 30,350,506 | 8,320,619 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු.44,069,507 ක් වූ මුළු ආදායමෙන් වර්ෂය අවසාන වන විට රු.12,154,244 ක් අයකර නොතිබුණු අතර එය මුළු බිල්කල ආදායමෙන් සියයට 27 ක් විය. | හිඟ මුදල් ඉදිරියේදී අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව කාරුණිව දන්වමි . | සභාව විසින් වර්ෂයට අදාලව බිල් කරන ලද ආදායම රැස්කර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සභාව සතු දේපල 12 ක් බදුදීම වෙනුවෙන් ලැබිය යුතු රු.16,733,475 ක් වූ ටෙන්ඩර් දේපල බදු ආදායමෙන් 2022 දෙසැම්බර් 31 දිනට හිඟ ටෙන්ඩර් බදු ආදායම රු.2,239,152 ක් විය. තවද සමාලෝචිත වර්ෂයේ ආරම්භයේදී පැවති හිඟ ටෙන්ඩර් දේපල බදු ආදායම අයවීමේ ප්‍රතිශතය සියයට 7 ක තරම් පහල ප්‍රතිශතයක් විය. | හිග මුදල් අයකර ගැනීමට හා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වමි. | සභාව වෙත ලැබිය යුතු හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුයි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ බදු දී තිබුණු කඩ කාමර 143 කින් 2022 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කාමර කුලී රු. 2,120,390 ක් විය. | ආදායම් පරීක්ෂක මහතා හා වෙළඳසැල් පරිපාලක මහතා දැනුවත්කර හිඟ මුදල් කඩිනමින් අයකරගැනීම සඳහා කටයුතු කරමින් පවතී . | ගිවිසුම් ප්‍රකාරව සභාව වෙත ලැබිය යුතු හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුයි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ සිදුකරන ලද ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර පිළිබඳ සමීක්ෂණයේදී වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු අයකළ යුතු වෙළඳ ව්‍යාපාර 876 ක් හඳුනාගෙන තිබුණු අතර ව්‍යාපාර ඒකක 363 ක් සඳහා පමණක් ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ලබා දීමට කටයුතු කර තිබුණි. | 2022 වර්ෂයේ ව්‍යාපාර සමීක්ෂණය ද 2023 වර්ෂයේ දී හඳුනාගන්නා නව ව්‍යාපාරික ස්ථාන ද මත පදනම්ව තව දුරටත් අපගේ බදු ආදායම් ඉහල නංවා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | සභාව විසින් බලප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන කර්මාන්ත සහ ව්‍යාපාර නියාමනය කළ යුතුයි. |
| (ඉ) | සභාවට අයත් යන්ත්‍ර 03 ක් කුලියට දීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.368,960 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන ඇත. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ඊ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.69,667 ක් සහ මුද්දර ගාස්තු රු.1,266,529 ක් විය. | අදාල හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීම සඳහා කටයුතු කරමි. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම් ගෙන්වා ගත යුතුයි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 98 ක් අතුරින් ක්‍රියාකාරකම් 70 ක් 2022 වර්ෂයේ ඉටුකර නොතිබුණු අතර එම සැලැස්මේ ඇතුලත් කර නොතිබුණු ක්‍රියාකාරකම් 06 ක් ඉටුකිරීම වෙනුවෙන් රු.985,000 ක් වැයකර තිබුණි. | 2022 වර්ෂයේ රට තුළ පැවති අයහපත් ආර්ථික වාතාවරණය තුළ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ ක්‍රියාකාරකම් 70 ක් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එම වර්ෂය තුළ පැවති අධික වර්ෂාව හේතුවෙන් ප්‍රදේශයේ ඇතැම් මාර්ග සොදා පාළුවට ලක් වීම නිසා මහජනතාව විසින් ගරු මන්ත්‍රීතුමන්ලා විසින් වෙත කරනු ලැබූ ඉල්ලීම් අනුව හදිසි අවශ්‍යතාව මත මාර්ග සංවර්ධන කටයුතු සිදු කරන ලද අතර එවැනි ක්‍රියාකාරකම් 06ක් ක්‍රියාකාරී සැලැස්මට බැහැරව සිදු කරන ලදි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ දක්වනු ලබන අරමුණු හා ක්‍රියාකාරකම් වර්ෂය තුලදී ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් මැදගම කසල ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම සඳහා 2021-2022 කාල පරිච්ඡේදය තුළ රු.1,114,807 ක් වැයකර තිබුණු නමුත් එහි කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සිදු නොකරන බවත් නොදිරන කසල අවිධිමත් පරිදි බැහැර කරන බවත් 2022 සැප්තැම්බර් 23 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | මැදගම ප්‍රාදේශීය සභාවට අයත් කසල ප්‍රතිචක්‍රියකරණ මධ්‍යස්ථානයේ කොම්පෝස්ට් 700 kg නිපදවා ඇත.එම කොම්පෝස්ට්වල ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහා ඌව විශ්ව විද්‍යාලය වෙත යොමු කර ඇතත් මේවන තුරු පිළිතුරු ලැබී නොමැත. ඉදිරියේදී මෙම කටයුතු තව දුරටත් විධිමත් කිරීමට කටයුතු කරමි. | කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමට කටයුතු කළයුතු අතර නොදිරන කසල විධිමත්ව බැහැර කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයි. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව විසින් ලබාදී තිබුණු පාරිසරික ආරක්ෂණ බලපත්‍ර 25 ක වලංගු කාලය ඉකුත්වී තිබුණු නමුත් එම බලපත්‍ර අළුත්කිරීමට කටයුතුකර නොතිබුණි. | 2019 වර්ෂයේ සිට රට තුළ පැවැති කොරෝනා ව්‍යසනයත් පසුව පැන නැඟුන ඉන්ධන ප්‍රශ්නයත් හේතුවෙන් විධිමත් ලෙස කර්මාන්ත පරීක්ෂාවකට යොමු වීමට නොහැකිවූ අතර ඉදිරියේදී එම කටයුතු විධිමත් කිරීමට අපේක්ෂා කරමි. | සභාව විසින් බලප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර හා කර්මාන්ත නියාමනය කළ යුතුයි. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම්වල ස්ථාපිත කර තිබුණු මැදගම බස් නැවතුම්පොල ගොඩනැගිල්ල, මොනරාවාන පෙර පාසල් ගොඩනැගිල්ල හා අමුනේකඳුර ප්‍රජාශාලාව යන ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේදී අවසන් ගිණුම සකස් කිරීමේදී ගොඩනැගිලිවල තාවකාලික තක්සේරුවක් සිදු කර එම වටිනාකම් ගිණුම් ගත කරන බව කාරුණිකව දන්වා සිටිමි. | සභාව සතු වත්කම්වල වටිනාකම තක්සේරු කර ගිණුම් ගතකළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දියුණු කළ ප්‍රදේශ අවසන් වරට 2015 වර්ෂයේ හඳුනාගෙන තිබුණද, වරිපනම් බදු අයකළ හැකි ප්‍රදේශය පුළුල් කර ගැනීමට සභාවේ අවධානය යොමුවී නොතිබුණි. | දියුණු කළ ප්‍රදේශ පුළුල් කර ගැනීමට අදාල කටයුතු සිදු කරමින් පවතින අතර කොටස් වශයෙන් හෝ අදාල ගාස්තු මිනින්දෝරු දෙපාර්තමේන්තුවට ගෙවා දියුණුකළ ප්‍රදේශ පුළුල් කිරීමට අප සභාව සාකච්ඡා කරමින් පවතී. | වරිපනම් බදු අය කළ හැකි ප්‍රදේශය පුළුල්කර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | අවසන් වරට 2015 වර්ෂයේ දී වරිපනම් බදු තක්සේරු කර තිබුණු අතර කාලීනව තක්සේරු කිරීම් සිදුකර නොතිබුණි. | තක්සේරු කිරීමට අවශ්‍ය දේපල ලැයිස්තු 2015 වර්ෂයේ තක්සේරු දෙපාර්තමේන්තුවට යවා තිබු අතර ඒ සඳහා වූ සම්පූර්ණ තක්සේරු වාර්තාව සභාව වෙත ලැබී ඇත්තේ 2020 වර්ෂයේදීය.මහ සභාවේ අනුමැතියට යටත්ව තක්සේරු විරෝධතා කැඳවා විරෝධතා පරීක්ෂණ 2022 වර්ෂයේ අවසන් කර 2023 වර්ෂයට ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති බැවින් කාලීන තක්සේරුවක් සිදු නොකල බව දන්වා සිටිමි. | වරිපනම් බදු තක්සේරු කිරිම කාලීනව කළ යුතුයි. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල,පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 27 දින සභාවේ සම්මන්ත්‍රණශාලාව සඳහා ශබ්ද විකාශන පද්ධතියක් මිලදී ගැනීමට අදාලව රු.767,050 ක් වැයකර තිබුණු අතර 2023 ජනවාරි 20 දින වන විටත් එය සම්මන්ත්‍රණ ශාලාවේ සවිකර නොතිබුණු අතර අදාල ශබ්ද විකාශන පද්ධතියේ වසරක වගකීම් කාලයද භාවිතයට ගැනීමට පෙර ඉක්මවා යමින් පැවතුණි. | මේ වන විට එම ශබ්ද විකාශන පද්ධතිය සවි කරමින් පවතින බව කාරුණිකව සඳහන් කරමි. | සභාව සතු වත්කම් උපරිම ඵලදායීතාවයෙන් සහ කාර්යක්ෂමතාවයෙන් ප්‍රයෝජනයට ගත යුතුයි. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 05 කට අදාලව අනුමත කාර්ය මණ්ඩලය අනුව සේවකයින් 06 දෙනෙකුගේ ඌනතාවයක් පැවති අතර 2023 ජනවාරි 23 දින වන විටත් එම පුරප්පාඩු පිරවීමට කටයුතුකර නොතිබුණි. | මෙම ඌනතාවයන් සම්බන්ධයෙන් මාසික කාර්ය මණ්ඩල තොරතුරු වාර්තාව මගින් දැනුම් දී ඇත. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුයි. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම් හා වර්ෂයේ තථ්‍ය ආදායම් අතර සියයට 7 සිට සියයට 86 දක්වාද වර්ෂයේ ඇස්තමේන්තු කළ වියදම හා තථ්‍ය වියදම අතර සියයට 68 සිට සියයට 3 දක්වා සැලකිය යුතු විචලනයන් පවතින බැවින් ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේදී රට තුළ පැවති අයහපත් ආර්ථික දුෂ්කරතා හේතුවෙන් අපේක්ෂිත ආදායම් හා ලැබීම් ප්‍රමාණය නොලැබුණු අතර , වැය ශීර්ෂ කිහිපයක අපේක්ෂා කරනු ලැබූ වියදම් ප්‍රමාණයට වඩා වියදම් ප්‍රමාණය ඉහළ ගොස් ඇති අතර ඉදිරියේදී මෙවන් විචලනයන් අවම වන පරිදි ආදායම් හා වියදම් සම්බන්ධයෙන් නිසි අවබෝධයෙන් යුතුව අයවැය පාලනය කිරීමට අවශ්‍යය කටයුතු සම්පාදනය කරමි. | නිවැරදි අයවැය ලේඛනයක් පිළියෙල කර එහි දක්වා ඇති ඉලක්ක සපුරාගත යුතුයි. |